සුළඟ අල්ලාහ්ගේ ආශිර්වාදයෙන් වූවකි. එය ආශිර්වාදය ගෙන එයි. එමෙන්ම දඬුවමද ගෙන එයි. එහෙයින් ඔබ එය දුටුවෙහු නම්, එයට නොබනිනු. එහි යහපත අල්ලාහ්ගෙන් ඉල්ලනු. එහි නපුරින් ආරක්ෂාව අල්ලාහ්ගෙන් පතනු.

අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- කළ ප්රකාශයකට තමන් සවන් දුන් බව
අබූ හුරෙය්රා -රළියල්ලාහු අන්හු- තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “සුළඟ
අල්ලාහ්ගේ ආශිර්වාදයෙන් වූවකි. එය ආශිර්වාදය ගෙන එයි. එමෙන්ම දඬුවමද ගෙන එයි.
එහෙයින් ඔබ එය දුටුවෙහු නම්, එයට නොබනිනු. එහි යහපත අල්ලාහ්ගෙන් ඉල්ලනු. එහි
නපුරින් ආරක්ෂාව අල්ලාහ්ගෙන් පතනු.“ [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් නසාඊ එය වාර්තා කර ඇත - ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත - අහ්මද් එය වාර්තා කර ඇත]

සුළඟ අල්ලාහ්ගේ ආශිර්වාදයකි යනු එය තම ගැත්තන් හට පිරිනමන ඔහුගේ කරුණාවය යන්නයි. එය ආශිර්වාදය ගෙන එයි. එමෙන්ම දඬුවමද ගෙන එයි. එනම්, අල්ලාහ් තම ගැත්තන් හට ආශිර්වාදයක් වශයෙන් සුළඟ එවනු ඇත. එමගින් යහපත හා අභිවෘද්ධිය ජනයාට හිමි වන්නේය. එය අල්ලාහ් කුර්ආනයේ පවසන පරිදි මෙසේය, "තවද සුළඟ අපි එවන්නෙමු එය සිදුවන්නකි." තවත් වැකියක, "අල්ලාහ් සුළඟ එවයි. එය වළාකුළු හට ගන්වයි. පසුව ඔහු අභිමත කරන පරිදි අහසෙහි එය ව්යාප්ත කරයි. පසුව එය අඳුරු බවට පත් කරයි. එවිට එය අතරින් වර්ෂාව හටගනු ඔබ දකිනු ඇත." තවත් වැකියක, "ඔහුගේ කරුණාව අතරින් ශුභාරංචියක් වශයෙන් සුළඟ එවනුයේ ඔහුය. එය වළාකුළු බර වන තෙක් වෙයි. මිය ගිය භූමියකට අපි එය සපයන්නෙමු. එවිට එමගින් වර්ෂාව පහළ වෙයි." දඬුවම ගෙන එන බව සඳහන් කරමින් පැමිණි වැකි මෙසේය. "එවිට මෙලොව ජීවිතයේ නින්දිත දඬුවම අප ඔවුනට භුක්ති විඳවනු පිණිස අසුබ දිනයන්හි දැඩි හඬ සහිත සුළී සුළඟක් අපි ඔවුන් වෙත එව්වෙමු." තවත් වැකියක, "මෙය අපට වැසි ගෙන දෙන වළාකුලකි යැයි ඔවුහු පැවසූහ. නැත. එය නුඹලා කවර දෙයක් ඉක්මණින් පැතුවෙහු ද එයයි. දැඩි සුළගකි. එහි වේදනීය දඬුවමක් ඇත." ඔබ එය දුටුවෙහු නම් එයට බැණ නොවදිනු. යන ප්රකාශය වනාහි, සුළඟට දොස් කීම මුස්ලිම්වරයකුට සුදුසු නොවන්නේය. හේතුව එය අල්ලාහ්ගේ මැවීම් අතුරින් වූ මැවීමක් බැවිනි. එය ඔහුගේ අණ පරිදි නියෝග කරනු ලැබූවකි. එයට කිසිදු බලපෑමක් සිදු කළ නොහැක. අල්ලාහ්ගේ නියෝගයෙන් මිස කිසිදු ඵලක් ගෙන දෙන්නට හෝ හානියක් සිදු කරන්නට හෝ එයට නොහැකිය. එයට දොස් නැගීම යනු එහි මැවුම්කරුට, එහි සැළසුම්කරුට දොස් නැගීමකි. ඔහු පාරිශුද්ධ වූ අල්ලාහ්ය. එහි යහපත අල්ලාහ්ගෙන් ඉල්ලනු. එහි නපුරින් ආරක්ෂාව අල්ලාහ්ගෙන් පතනු. සුළඟට බැණ වැදීමෙන් වැළැක්වූ නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා, එය හමන විට එහි යහපත අල්ලාහ්ගෙන් පතන මෙන් ද එහි අයහපතින් ආරක්ෂාව පතන මෙන් ද මඟ පෙන්වූහ. එහි අර්ථය, එය උසුලා එන යහපත තමන්ට නියම කර දෙන මෙන් ද එය උසුලා එන අයහපත තමන්ගෙන් වෙනතකට යොමු කරන මෙන් ද අල්ලාහ්ගෙන් අයැද සිටීමය.

http://www.sunnah.global/hadeeth/si/show/8957